(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 131.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 ඔක්තෝබර් මස 21 වැනි සිකුරාදා අ. භා. 1.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0479/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්ය භාරය කවරේද;

(ii) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් විමර්ශනය කරනු ලැබ ඇති, අභ්‍යන්තරික තැනැත්තන් විසින් සිදු කරන ලද වංචනික ගනුදෙනු සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන කටයුතුවලට සම්බන්ධ නම් සහ සිද්ධි කවරේද;

(iv) මේ වන විට එම විමර්ශන කටයුතුවලින් ලැබී ඇති ප්‍රතිඵල කවරේද;

(v) එම සිද්ධි සමථයකට පත් කොට හෝ ඒ වෙනුවෙන් දඩ මුදල් අය කරනු ලැබ තිබේද;

(vi) අය කරනු ලැබූ දඩ මුදල් ප්‍රමාණයන් සහ එක් එක් පැමිණිල්ල සමථයකට පත් කරනු ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0956/'10

2.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාතර, පඹුරණ, සුමනසාර මාවත, අංක 35B දරන ලිපිනයේ පදිංචි ශාන්ති ප්‍රේමරත්න මහත්මිය සෞදි අරාබියේ රැකියාවක් සඳහා 2007.11.19 දින විදේශ ගත වූ බවත්;

(ii) දැනට වර්ෂ තුනක් ගතවී ඇතත් මේ දක්වා ඇය ගැන කිසිදු තොරතුරක් ලැබී නොමැති බවත්;

(iii) මේ පිළිබඳව ඇයගේ ස්වාමිපුරුෂයා වන සුසිල් ප්‍රේමරත්න මහතා මාතර විදේශ සේවා නියුක්ති කාර්යාංශයට පැමිණිලි කළ ද, ඊට කිසිදු ප්‍රතිචාරයක් මෙතෙක් ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශාන්ති ප්‍රේමරත්න මහත්මිය පිළිබඳව සොයා බලා ඇය ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0959/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ නීතිගත කරන ලද බලපත්‍රලාභී කැසිනෝ ශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පවත්වාගෙන යන ස්ථාන කවරේද;

(iii) ඒවායේ අයිතිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) එම එක් එක් ආයතනය ආරම්භ කළ වර්ෂය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2005 සිට මේ දක්වා කැසිනෝ ශාලා වෙතින් රජයට ලැබුණු බදු ආදායම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කැසිනෝ ශාලාවක් ආරම්භ කිරීමට බලපත්‍රයක් ලබා ගන්නා ක්‍රමවේදය කවරේද;

(iii) බලපත්‍ර ලබාදීමේදී අවසන් අනුමතිය ලබා දෙන්නා කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී කැසිනෝ ශාලා නව බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව කවරේද;

(ii) ඒ අතරින් බලපත්‍ර ලබා දෙන සංඛ්‍යාව කවරේද;

(iii) එසේ බලපත්‍ර ලබන අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1438/'11

4.

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරක්ෂක අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1534/'11

5.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) යාපනය - නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ පවතින පූම්පුකාර් ගම්මානයේ පාසලක් මේ වන විට පෞද්ගලික නිවසක පවත්වාගෙන යනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) පවුල් 50කට වැඩි සංඛ්‍යාවක් නැවත පදිංචිකර ඇති මෙම ගම්මානයේ පවුල්වල දරුවන්ගේ අනාගත අධ්‍යාපන අභිවෘද්ධිය සැලකිල්ලට ගෙන ස්ථිර පාසල් ගොඩනැගිල්ලක් ඉදිකරදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1592/'11

6.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, රන්මිණිතැන්න ටෙලි ගම්මානය ඉදිකිරීමට දරන ලද මුළු වියදම කොපමණද;

(ii) දැනට එම ගම්මානය යොදා ගනිමින් නිමකර ඇති නිර්මාණ සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගම්මානය නිර්මාණ කටයුතු සඳහා කලාකරුවන්ට ලබා දීමේදී මුදල් අයකරනු ලබන්නේද;

(iv) එසේ නම්, මේ වනවිට එමගින් උපයා ඇති ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රන්මිණිතැන්න ගම්මානයේ නඩත්තු කටයුතු සඳහා සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එහි පරිපාලනය හා නඩත්තුව සඳහා මාසිකව වැයවන මුදල කොපමණද;

(iii) මෙම ගම්මානය පරිහරණයේදී ආර්ථික දුෂ්කරතා සහිත කලාකරුවන්ට ලබා දෙන විශේෂ සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1614/'11

7.

ගරු ඊ. සරවනපවන් මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මරුදන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි සේවයෙහි නිරත ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) යළි පදිංචි කිරීමේ කටයුතු සිදුකෙරෙන මෙකී ප්‍රදේශයන්හි පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපනය පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 15 තුළ පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) යාපනය දිස්ත්‍රික්කයෙහි දැනට ස්ථිර ග්‍රාම නිලධාරීන් නොමැති, වැඩ බලන ග්‍රාම නිලධාරීන් විසින් සේවා ආවරණය කරන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ප්‍රදේශයේ පවතින ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1094/'11

8.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයාට සහ ඔහුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන අතරින් කොන්ත්‍රාත් සහ කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද ;

(iii) එම වාහනවල ලියාපදිංචි අංක සහ වර්ගයන් කවරේද;

(iv) ඉහත වාහන සඳහා මාසිකව ගෙවනු ලබන මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් එක් එක් වාහනයේ රියදුරාගේ නම, වයස සහ සේවයට බඳවාගත් දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් රාජ්‍ය සේවයෙන් එම තනතුරු සඳහා අනුයුක්ත කර තිබේ නම්, ඒ ආයතන කවරේද;

(iii) කොන්ත්‍රාත් පදනම යටතේ අලුතින් රියදුරන් බඳවාගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගේ ආරක්ෂක සේවයට යොදවා තිබෙන වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවල අංකයන් සහ වර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1197/'11

9.

ගරු රවී කරුණානායක මහතා,— සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහ තුළ, එක් එක් වර්ෂයේ දී,

(i) සමස්ත බිත්තර පරිභෝජනය සහ ඒක පුද්ගල බිත්තර පරිභෝජනය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ බිත්තර නිෂ්පාදන පිරිවැය කොපමණද;

(iii) ආනයනය කරන ලද බිත්තර ප්‍රමාණය කොපමණද;

(iv) ආනයනය කරන ලද බිත්තර ප්‍රමාණයෙහි වටිනාකම කොපමණද;

(v) බිත්තර ආනයනකරුවන් වෙත ලබාදුන් තත්‍ය සහනාධාරය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරනු ලබන බිත්තරවලට සහ දේශීයව නිෂ්පාදනය කරනු ලබන බිත්තරවලට පනවා ඇති සියලු ඍජු හා වක්‍ර බදු කවරේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1285/'11

10.

ගරු බුද්ධික පතිරණ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර - කොළඹ දුම්රිය මාර්ගය සංවර්ධන කටයුතු සඳහා සැලසුම් කර ඇති අදියර ගණන කොපමණද;

(ii) එම අදියර අතරින් ගාල්ල හා මාතර අතර දුම්රිය මාර්ග සංවර්ධන අදියර හැර අනෙකුත් අදියරයන් සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිපාදන සපයනු ලබන දේශීය හෝ විදේශීය ආයතන කවරේද;

(iv) එය විදේශීය වශයෙන් ලබා ගන්නා ණය මුදලක් නම්, ඒ සඳහා අය කරනු ලබන පොලී අනුපාතය කවරේද;

(v) එම ණය මුදල ගෙවා නිම කළ යුතු කාලසීමාව කොපමණද;

(vi) ණය සම්බන්ධයෙන් පනවා ඇති කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දුම්රිය මාර්ගය සංවර්ධනය කිරීමෙන් පසුව දුම්රිය ධාවනයේ ඇතිවන කාර්යක්ෂමතාව කොපමණ ප්‍රතිශතයකින් වැඩි වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1439/'11

11.

ගරු අජිත් කුමාර මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1096/'11

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකාවේ විදුලි බල පහසුකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2010 මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි දැනට විදුලි බලය ලැබී නොමැති, භූමිතෙල් පරිභෝජනයෙන් ආලෝකය ලබා ගන්නා සෑම පවුලකටම මසකට භූමිතෙල් ලීටර් 5ක් බැගින් නොමිලේ ලබාදීමේ වැඩ පිළිවෙළ මේ වනවිට ක්‍රියාත්මක කර තිබේද;

(iii) නොඑසේ නම්, එම සහනය අඩු ආදායම්ලාභී ජනයාට ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහින්ද චින්තනයේ සඳහන් ආකාරයට අඩු ආදායම්ලාභීන්ගේ ගෘහස්ථ විදුලි බිලට 30% වට්ටමක් ලබා දීමට මේ වනවිට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඔවුන්ට එම සහනය ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1286/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට, උතුරු එක්නැලිගොඩ ප්‍රජා ජල යෝජනා ක්‍රමය මීට වර්ෂ 13කට පෙර ලෝක බැංකු ආධාර යටතේ ඉදිකළ ව්‍යාපෘතියක් බවත්;

(ii) මෙම ජල ව්‍යාපෘතියේ පවත්නා අකාර්යක්ෂමතා නිසා එමගින් ජල පහසුකම් ලබන ප්‍රදේශයේ ජනතාව දැඩි පානීය ජල හිඟයකින් පීඩා විඳින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය මගින් මේ වනවිට ජලය සපයනු ලබන ජල පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) අලුතින් ජල සැපයුම සඳහා ඉල්ලුම් කර ඇති පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) උතුරු එක්නැලිගොඩ ප්‍රජා ජල යෝජනා ක්‍රමය රජයට පවරා ගෙන වඩාත් කාර්යක්ෂම ලෙස ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iv) වෙන් කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1379/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නීතිපති දෙපාර්තමේන්තුව ක්‍රියාත්මකවන්නේ කවර ආයතනයක්/පුද්ගලයකු යටතේද;

(ii) නීතිපති දෙපාර්තමේන්තුව සඳහා වර්ෂයකට ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කාර්ය මණ්ඩලයේ එක් එක් කාණ්ඩය අනුව සේවක සංඛ්‍යාව බෙදී ඇති ආකාරය කවරේද; සහ

(v) ජ්‍යෙෂ්ඨත්වයේ අනුපිළිවෙළ අනුව නීතිපතිවරයාගේ සිට පහළට සිටිනා ජ්‍යෙෂ්ඨතම රජයේ අධිනීතිඥවරුන් 15 දෙනාගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නීතිපතිවරයා පත් කරනු ලබන්නේ නීතිපති දෙපාර්තමේන්තුව තුළින්මද; නැතහොත් ඉන් පරිබාහිරවද;

(ii) නීතිපතිවරයා නීතිපති දෙපාර්තමේන්තුවට පරිබාහිරව පත් කරනු ලැබේ නම්, තෝරා ගැනීමේ නිර්නායක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1440/'11

15.

ගරු අජිත් කුමාර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන්ට ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන්ට ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඔවුන්ට දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2011.04.07 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලා අ. භා. 1.30 සිට අ. භා. 7.00 දක්වා විය යුතු ය. අ. භා. 2.30 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*7.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*13.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*14.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*15.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

19.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

20.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

22.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

23.

දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

24.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**